**සබරගමුව පළාත් සමාජ සුබසාධන,පරිවාස හා ළමාරක්ෂක,ග්‍රාම සංවර්ධන**

**හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය**

**සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ**

**උපදේශක (කර්මාන්ත) ජුකී මැහුම් III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2024**

**1.0** 2019.10.28 දින සිට ක්‍රියාත්මක වන පරිදි සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද සබරගමුව පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - බණ්ඩ 2 සේවා ගණය (MN 1 – 2016) **උපදේශක (කර්මාන්ත) ජුකී මැහුම් III වන ශ්‍රේණියේ තනතුරට** බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**2.0** මෙම විභාගය සබරගමුව පළාත් සමාජ සුබසාධන, පරිවාස හා ළමාරක්ෂක, ග්‍රාම සංවර්ධන සහ ග්‍රාමීය කර්මාන්ත විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වෙන දිනය යථා කාලයේදී දන්වනු ඇත. මෙම විභාග ප්‍රතිඵල අනුව 1990.03.09 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 හි සඳහන් විධිවිධානයන් පරිදි ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණයෙන් සමත්වූවන්ගෙන් ලබා ගන්නා ලද මුළු ලකුණු එකතුවෙන් කුසලතා අනුපිළිවෙල අනුව සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්, සබරගමුව පළාත් රාජ්‍ය සේවයෙහි උපදේශක (කර්මාන්ත) ජුකී මැහුම් III වන ශ්‍රේණියේ තනතුරු සඳහා පත් කිරීමට තෝරා ගනු ඇත.

**3.0** මෙම විවෘත තරඟ විභාගය මඟින් සම්පූර්ණ කරනු ලබන **පුරප්පාඩු සංඛ්‍යාව 01**කි.පත්වීම ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. මෙම බඳවා ගැනීමේ නිවේදනය අනුව පුරප්පාඩු පිරවීම හෝ පුරප්පාඩු නොපිරවීම සම්බන්ධයෙන් අවසාන තීරණය ගැනීම සබරගමුව පළාත් සමාජ සුබසාධන, පරිවාස හා ළමාරක්ෂක,ග්‍රාම සංවර්ධන හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් සතුවේ.

**4.0 තනතුරට හිමි වැටුප් පරිමාණය:**

අංක 03/2016 හා 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව **උපදේශක (කර්මාන්ත) ජුකී මැහුම් III වැනි ශ්‍රේණියට** අදාළ වැටුප් කාණ්ඩය MN1-2016 වන අතර අදාළ මාසික වැටුප් පරිමාණය රු.27,140-10×300-11×350-10×495-10×660- රු.45,540/- වේ.

**5.0 සුදුසුකම්:- සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ උපදේශක (කර්මාන්ත) ජුකී මැහුම් III වන ශ්‍රේණියේ** තනතුරට බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් අදාළ වේ.

(අ).**අධ්‍යාපන සුදුසුකම් :**

i. මව්බස (සිංහල /දෙමළ /ඉංග්‍රීසි භාෂාව), ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම

සහ

ii. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

(ආ).**වෘත්තීය සුදුසුකම් :**

i. ජුකී මැහුම් ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ – 4) නිපුණතාවය ලබා තිබීම.

හෝ

ii. කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව/ රජයේ පිළිගත් ආයතනයක් විසින් පිරිනමනු ලබන වෘත්තියට අදාල දෑ අවුරුදු පාඨමාලා සහතිකයක් ලබා තිබීම. (පළමු කාර්යක්ෂමතා කඩඉමට පෙර NVQ– 4 නිපුණතාවය ලබා ගත යුතුය.)

(ඇ).**පළපුරුද්ද:**

අදාළ නොවේ.

(ඈ) **කායික සුදුසුකම් :**

සෑම අපේක්ෂකයකුම සබරගමුව පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

**(ඉ) වෙනත් :**

I. අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

II. අයදුම්පත් කැඳවනු ලබන දිනට අයදුම්කරු සබරගමුව පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු අතර අයදුම්පත් කැඳවනු ලබන දිනට පූර්වාසන්න වසර 03 තුළ අයදුම්කරුට සබරගමුව පළාතේ වසර 03 ක ස්ථිර පදිංචිය නොමැත්තේ නම් අයදුම්කරුගේ කලත්‍රයා අයදුම්පත් කැඳවනු ලබන දිනට පූර්වාසන්න වසර 03 ක කාලය තුළ සබරගමුව පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

III. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.

IV. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් එම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

(ඊ) වයස් සීමාව

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

(උ).බඳවා ගැනීමේ ක්‍රමය

ලිඛිත හා වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.ලිඛිත පරීක්ෂණයෙන් සමත් වූවන් පමණක් වෘත්තීය පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර ලිඛිත හා වෘත්තීය පරීක්ෂණයන් දෙකෙන්ම සමත් වූවන්ගෙන් ලබාගන්නා ලද මුළු ලකුණු එකතුවෙන් වැඩි ලකුණු ලබාගන්නා අයදුම්කරුවන් කුසලතා අනුපිළිවෙලට පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට අනුව බඳවා ගනු ලැබේ. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 හි සඳහන් විධිවිධාන වලට අනුකූලව කටයුතු කරනු ලැබේ.

**6.0 විභාග පටිපාටිය :**

**(අ) ලිඛිත පරීක්ෂණය**

මෙම ලිඛිත විභාගය සිංහල හා දෙමළ මාධ්‍යවලින් පමණක් පැවැත්වේ. අපේක්ෂකයන්ට සිය මනාපය පරිදි මින් එක් භාෂා මාධ්‍යයකින් පමණක් මෙම විභාගයට පෙනී සිටිය හැකි අතර ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. මෙම විභාගය ප්‍රශ්න පත්‍ර 02කින් සමන්විත වේ.ප්‍රශ්න පත්‍ර සමත්වීම සඳහා අවම වශයෙන් එක් එක් ප්‍රශ්න පත්‍රය වෙනුවෙන් ලකුණු 40 ක් ලබාගත යුතුය.

| **විෂයය** | **ලකුණු** | **කාලය** |
|---|---|---|
| 01. සාමාන්‍ය දැනීම | 100 | පැය 01 යි |
| 02. විෂයානුබද්ධ දැනුම | 100 | පැය 02 යි |

**ඉහත විෂයයනට අදාළ විෂය නිර්දේශය පහත පරිදි වේ.**

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 01. සාමාන්‍ය දැනීම | ශ්‍රී ලංකාවේ හා ජාත්‍යන්තර කාලීන, සමාජීය, දේශපාලන, ආර්ථික තොරතුරු පිළිබඳ විශේෂ අවධානය යොමු කරමින් සැකසුන ප්‍රශ්න පත්‍රයකි. |
| 02. විෂයානුබද්ධ දැනුම<br><br>ජුකී මැහුම් පුහුණු පිළිබඳ අවබෝධය | • ජුකී මැෂිමක සාමාන්‍ය ක්‍රියාකාරිත්වය හා එහි භාවිතය පිළිබඳ සාමාන්‍ය දැනුම<br>• තනි කටුවේ ලොක් ස්ටිච් මහන යන්ත්‍රය පිළිබඳ දැනුම<br>• තනි කටුවේ ලොක්ස්ටිච් මහන යන්ත්‍රය භාවිතයෙන් මූලික මැහුම් මැසීම පිළිබඳ දැනුම<br>• තනි කටුවේ ලොක්ස්ටිච් මහන යන්ත්‍රය භාවිත කර විශේෂ කාර්යයන් කිරීම පිළිබඳ දැනුම<br>• ඇඟලුම් ඕවර් ලොක් කිරීම පිළිබඳ දැනුම<br>• සේෆ්ටි ස්ටිච් ඕවර් ලොක් මහන යන්ත්‍රය ක්‍රියාකරවීම සඳහා සූදානම් කිරීම පිළිබඳ දැනුම<br>• ඉදිකටු දෙකක් සහිත මහන යන්ත්‍ර ක්‍රියාකරවීම පිළිබඳ දැනුම<br>• ඇඳුම් මැසීමේදී සිග් සැග් මහන යන්ත්‍රය ක්‍රියාකරවීම පිළිබඳ දැනුම<br>• ෆ්ලැට් ලොක් මහන යන්ත්‍රය ක්‍රියාකරවීම පිළිබඳ දැනුම |

**(ආ) වෘත්තීය පරීක්ෂණය (ප්‍රායෝගික)**

| **විෂයය** | **ලකුණු** | **කාලය** |
|---|---|---|
| 01. ජුකී මැහුම් පුහුණු පිළිබඳ දැනුම | 100 | පැය 02 |

| **ප්‍රශ්න පත්‍රයේ නම** | **විෂය නිර්දේශය** |
|---|---|
| ජුකීමැහුම් පුහුණු පිළිබඳ දැනුම | • තනි ඉදිකටුවේ ලොක් ස්ටිච් මහන යන්ත්‍රය මැසීමට සූදානම් කිරිම<br>• තනි ඉදිකටුවේ ලොක් ස්ටිච් මහන යන්ත්‍රය භාවිතයෙන් මූලික මැහුම් මැසීම<br>• ඇඟලුම් ඕවර් ලොක් කිරිම<br>• ඉදිකටු 02 ක් සහිත මහන යන්ත්‍රය ක්‍රියා කරවිම<br>• ඇඳුම් මැසීමේදී මහන යන්ත්‍රය ක්‍රියා කරවිම<br>• ෆ්ලැට් ලොක් මහන යන්ත්‍රය ක්‍රියා කරවිම |

වෘත්තීය පරීක්ෂණය සමත්වීම සඳහා අවම වශයෙන් ලකුණු 40 ක් ලබාගත යුතුය.

(ඇ) සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය
ලිඛිත හා වෘත්තීය පරීක්ෂණයෙන් සමත් වූවන් සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ.මේ සඳහා ලකුණු දෙනු නොලැබේ.

**7.0 විභාග ගාස්තු :**

විභාග ගාස්තුව රු.600 /- කි. එම විභාග ගාස්තුව සබරගමුව පළාත් සභාවේ ඕනෑම අමාත්‍යාංශයකට/ දෙපාර්තමේන්තුවකට (පළාත් පාලන ආයතන හැර) හෝ සබරගමුව පළාත තුළ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා නිකුත් කරන කුවිතාන්සිය අයදුම්පතේ අදාළ කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. **<u>එම විභාග ගාස්තුව ගෙවිය යුත්තේ සබරගමුව පළාත් සභා ආදායම් ශීර්ෂ 20.03.02.99 ට බැරවන ලෙසය.</u>**ගෙවනු ලබන විභාග ගාස්තුව කිසිදු හේතුවක් මත ආපසු ගෙවනු නොලබන අතර, මුදල් ඇණවුම්, මුද්දර භාරගනු නොලැබේ. මුදල් ගෙවා ලබාගන්නා ලද කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබාගත යුතු වේ.

**8.0 අයදුම්පත්‍ර :**

A4 (21cmx29cm) ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්ත භාවිතා කරමින්,

(අ). අංක 01 සිට 04 තෙක් ඡේදයන් පළමුවන පිටුවට ද
(ආ). අංක 05 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලට ද ඇතුළත් වන සේ කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත්‍රය පිළියෙල කරගත යුතු අතර අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අදහස් කරන භාෂාවෙන් තම අත් අකුරින්ම පැහැදිලිව අයදුම්පත්‍රය පිරවිය යුතුය.

නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන හෝ නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හෝ නියමිත සුදුසුකම් සහ අධ්‍යාපන සුදුසුකම් සපුරා නොමැති හෝ නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති අතර සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතුවේ. නිසි පරිදි ලබා දී ඇති උපදෙස් අනුව සම්පූර්ණ නොකරන ලද අයදුම්පත්‍ර සම්බන්ධව වග කියනු නොලැබේ.

8.1. මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කරන ලද අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන්ට තරඟ විභාගයට පෙනී සිටීමට සබරගමුව පළාත් සමාජ සුබසාධන, පරිවාස හා ළමාරක්ෂක, ග්‍රාම සංවර්ධන සහ ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය විසින් ඉඩදෙනු ලැබේ. තරඟ විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා බඳවා ගැනීමේ නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේදී අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. අයදුම්කරු විසින් විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය වේ.

8.2. අයදුම්පත්‍රයේද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් විභාගයට අයදුම්කරන අයදුම්කරුවෙකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා ද එසේ නොවන අයදුම්කරුවෙකු තම අත්සන රජයේ ප්‍රධානියකු/ විශ්‍රාමික නිලධාරියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයකු, සාමදාන විනිශ්වයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධාරියකු, රජයේ හෝ පළාත් හෝ රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජා ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයෙකු හෝ ලවා සහතික කරවාගත යුතුය.

8.3.සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2024.08.30 දිනට හෝ ඊට පෙර **"ලේකම්, සමාජ සුබසාධන, පරිවාස හා ළමාරක්ෂක, ග්‍රාම සංවර්ධන හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය, සබරගමුව පළාත් සභාව, නවනගරය, රත්නපුර"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

8.4.අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ උපදේශක (කර්මාන්ත) ජුකී මැහුම් III වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය -2024 "**යන්න සඳහන් කරන්න.

9.0.අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලි වලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය
iii. වලංගු රියදුරු බලපත්‍රය

**10.0 ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්**

ඉල්ලුම්පත්‍රය පිරවීමේදී ඉතා සැළකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පවත්වන අවස්ථාවේදී හෝ විභාගයෙන් පසු හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන.

**11.0** මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව සබරගමුව පළාත් සමාජ සුබසාධන, පරිවාස හා ළමාරක්ෂක, ග්‍රාම සංවර්ධන හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වේ. සියලුම අයදුම්කරුවන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

දිනීෂා එස්. රත්නායක
ලේකම්
සමාජ සුබසාධන, පරිවාස හා ළමාරක්ෂක,
ග්‍රාම සංවර්ධන සහ ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය
සබරගමුව පළාත් සභාව

2024 ජූලි මස 11 දින.

| සබරගමුව පළාත් රාජ්‍ය සේවය |
|---|

සබරගමුව පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ උපදේශක (කර්මාන්ත - ප්‍රකී මැහුම්)
III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2024

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

අයදුම්කරු ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : රත්නපුර - 25 / කෑගල්ල - 24 [ ]
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

1.0 1.1 මුලකරු අගට යොදා මුලකුරු සමඟ නම :
..........................................................................................
..........................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ( උදා : PERERA, A.B.C )

1.2 සම්පූර්ණ නම : ..........................................................................................
..........................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 සම්පූර්ණ නම :..........................................................................................
..........................................................................................
(සිංහලෙන්/ දෙමළෙන්)

1.4 ජාතික හැඳුනුම්පත් අංකය:

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

2.0 2.1 ස්ථිර ලිපිනය :..........................................................................................
..........................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

2.2 ස්ථිර ලිපිනය:..........................................................................................
..........................................................................................
(සිංහලෙන්/දෙමළෙන්)

2.3 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය : ..........................................................................................
..........................................................................................

2.4 පෞද්ගලික දුරකථන අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

3.0 ස්ත්‍රී/ පුරුෂ භාවය : පුරුෂ - 0 / ස්ත්‍රී - 1 [ ]
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

4.0 4.1 උපන් දිනය : වර්ෂය [ ][ ][ ][ ] මාසය [ ][ ] දිනය [ ][ ]

4.2 ......................දිනට වයසස : අවුරුදු | | | මාස | | | දින | | |

5.0 පදිංචිය සනාථ කිරීම

5.1 සබරගමුව පළාත තුළ ස්ථිර පදිංචිය ඇත්තේ අයදුම්කරුට ද? කලත්‍රයාට ද? යන වග :
..............................................................................................................................

5.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය: ..........................................................................

5.3 සබරගමුව පළාත තුළ පදිංචිව සිටින කාල සීමාව :
.................................සිට ...............................දක්වා

5.4 ග්‍රාම නිලධාරී කොට්ඨාසය : ...........................................................................

6.0 අධ්‍යාපන සුදුසුකම්

6.1 අ.පො.ස. (සා.පෙළ) විභාගය පිළිබඳ විස්තරය

i. විභාගයේ වර්ෂය හා මාසය: ................................................
ii. විභාග අංකය : ..................................................................
iii. ප්‍රතිඵල :

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

6.2 අ.පො.ස. (උ.පෙළ) විභාගය පිළිබඳ විස්තරය

i. විභාගයේ වර්ෂය හා මාසය: .....................................................
ii. විභාග අංකය: ..........................................................................
iii. ප්‍රතිඵල:

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 3. | |
| 2. | | 4. | |

6.3 වෘත්තීය සුදුසුකම්

i. සහතික පත්‍රයේ අංකය : ....................................
ii. නිකුත් කළ දිනය : .............................................
iii. සහතික පත්‍රය අදාළ පාඨමාලාවේ නම : ............................................
iv. සහතික පත්‍රය නිකුත් කළ ආයතනයේ නම : ..........................................................
(සහතික පත්‍රයේ ඡායා පිටපත් ඉදිරිපත් කළ යුතුය.)

7.0 ඔබ කවරදාක හෝ කවර චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද?
(අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න) (ඔව් නම් විස්තර සඳහන් කරන්න.)

ඔව් නැත

8.0 විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර

i. විභාග ගාස්තු ගෙවූ කාර්යාලය : ......................................
ii. ලදුපතේ අංකය හා දිනය : ..............................................
iii. ගෙවූ මුදල : ..................................................................

| |
|---|
| ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.<br>(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) |

9.0 අයදුම්කරුගේ සහතිකය :

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමෙහි හා විශ්වාසයේ හැටියට සත්‍ය ව ප්‍රකාශ කරමි.මා විසින් සපයා ඇති තොරතුරු අසම්පූර්ණ හෝ අසත්‍ය බව මෙම තනතුරට තෝරාගැනීමට පෙර අනාවරණය වුවහොත් අයදුම්පත් ප්‍රතික්ෂේප වන බවත්, පසුව අනාවරණය වුවහොත් මා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දනිමි. තවද සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම සම්බන්ධයෙන් සමාජ සුබසාධන, පරිවාස හා ළමාරක්ෂක, ග්‍රාම සංවර්ධන සහ ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශ ලේකම් විසින් හෝ බලය පවරනු ලබන වෙනත් ආයතනයක් විසින් පනවනු ලබන නීතිරීති වලට හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණ වලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

දිනය: ........................ ........................................................

අයදුම්කරුගේ අත්සන

10.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරනු ලබන ................................................................ මයා / මිය / මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවටත් ඔහු/ඇය මා ඉදිරිපිටදී .....................................දින ඔහුගේ /ඇයගේ අත්සන තැබූ බවටත් මුදල් ගෙවන ලද ලදුපත අලවා ඇති බවටත් සහතික කරමි.

දිනය:............................... ........................................................

සහතික කරන්නාගේ අත්සන

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම : ......................................................
තනතුර: ...................................................
ලිපිනය: ...................................................

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)